# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1999/43 – 2016 දෙසැම්බර් 30 වැනි සිකුරාදා – 2016.12.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගගබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, අපරැක්ක ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක එම්ආර්/ටීඑච්ජී/ආර්ඩීජී/2016/421 හා 2016.10.05 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 1 – දොඹගහකොරටුව – ප්‍රමාණය: හෙක්. 0.0026**
උතුරට: ඒ. සී. සෙනරත් යාපා හිමිකම් කියන දොඹගහකොරටුව, මාර්ගය සහ කැබලි අංක 6; නැගෙනහිරට: කැබලි අංක 6; දකුණට: කැබලි අංක 2, සී. ඩබ්. ජයසේකර හිමිකම් කියන පරගහවත්ත සහ ඒ. සී. සෙනරත් යාපා හිමිකම් කියන දොඹගහකොරටුව; බටහිරට: ඒ. සී. සෙනරත් යාපා හිමිකම් කියන දොඹගහකොරටුව.

02. **කැබලි අංක 2 – පරගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0028**
උතුරට: කැබලි අංක 1 සහ 6; නැගෙනහිරට: කැබලි අංක 6; දකුණට: කැබලි අංක 3, හිමිකම් කියන අය සොයාගත නොහැකි පරගහවත්ත සහ සී. ඩබ්ලිව්. ජයසේකර හිමිකම් කියන පරගහවත්ත; බටහිරට: සී. ඩබ්ලිව්. ජයසේකර හිමිකම් කියන පරගහවත්ත සහ ඒ. සී. සෙනරත් යාපා හිමිකම් කියන දොඹගහකොරටුව.

03. **කැබලි අංක 3 – පරගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0083**
උතුරට: කැබලි අංක 2 සහ 6; නැගෙනහිරට: කැබලි අංක 6; දකුණට: කැබලි අංක 4, හිමිකම් කියන අය සොයාගත නොහැකි කෝපිවත්ත සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි පරගහවත්ත; බටහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි පරගහවත්ත සහ සී. ඩබ්ලිව්. ජයසේකර හිමිකම් කියන පරගහවත්ත.

04. **කැබලි අංක 4 – කෝපිවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0020**
උතුරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි පරගහවත්ත, කැබලි අංක 3 සහ 6; නැගෙනහිරට: කැබලි අංක 6; දකුණට: කැබලි අංක 5, නන්දතිලක කෝරළගේ සහ නන්දන කෝරළගේ හිමිකම් කියන කෝපිවත්ත; බටහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි කෝපිවත්ත.

05. **කැබලි අංක 5 – කෝපිවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0054**
උතුරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි කෝපිවත්ත, කැබලි අංක 4 සහ 6; නැගෙනහිරට: කැබලි අංක 6; දකුණට: මාර්ගය සහ නන්දතිලක කෝරළගේ සහ නන්දන කෝරළගේ හිමිකම් කියන කෝපිවත්ත; බටහිරට: නන්දතිලක කෝරළගේ සහ නන්දන කෝරළගේ හිමිකම් කියන කෝපිවත්ත.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

යොමු අංකය: 4-3/6/2016/එච්ඩබ්/242.
2016 දෙසැම්බර් මස 04 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

01 - 423